
Sinhala or Sinhalese | සිංහල

GOVERNMENT OF WESTERN AUSTRALIA

**Roll up for WA**
COVID-19 Vaccination

# එන්නත ගැන තොරතුරු දැන ගන්න





අලුත් දේවල් ගැන ගැටලු ඇති වීම සාමාන්‍ය කරුණකි. කෝවිඩ් -19 එන්නත් ගැන සත්‍ය මොනවාද එසේ නොවන්නේ මොනවාද කියා දැන ගන්න. එන්නත්කරණයට ලක් වූ සෑම කෙනෙක් ම අපට වසංගතයට පිටුපෑමට උපකාරී වන නිසා අප විසින් එන්නත් ගැන විශ්වාසය ගොඩනැගීමට කටයුතු කළ වේ.

## සත්‍ය




### එන්නත් ආරක්ෂිතය

ලොව පුරා බොහෝ දෙනෙක් මාස කිහිපයකින් කෝවිඩ්-19 එන්නත නිපදවීමට මුදල් හා විද්‍යාඥයන්ගේ දැනුම බෙදා හදා ගනිමින් එක් පියවරක්වත් මග නොහැර කටයුතු කර ඇත. ඔස්ට්‍රේලියාවේ එන්නත් භාවිත කිරීමට අවසර දී ඇත්තේ පරීක්ෂා කර ආරක්ෂිත බව හා ඵලදායී බව තහවුරු ගැනීමෙන් අනතුරුවය. සියලු එන්නත් වල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සහ ආරක්ෂාව සඳහා අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කෙරේ.



### කෝවිඩ්-19 එන්නතේ සජීවී කෝවිඩ් වයිරසය අඩංගු නොවන අතර එමගින් ඔබට කෝවිඩ්-19 නොවැළඳේ

එන්නත මගින් සැබෑ වයිරසය ලෙස ව්‍යාජව පෙන්වමින් තමා ආරක්ෂා කරගන්නා ආකාරය ශරීරයට උගන්වයි. මෙමගින් ඔබ දරුණු ලෙස අසනීප වීම, රෝහල් ගත වීමට සිදුවීම මෙන් ම මරණයට පත්වීම ද වැලැක්වීමට උපකාරී වනු ඇත.



### මයික්‍රොචිපයක් එන්නත් කටුවට සවි කළ නොහැක

මෙම මිත්‍යාව අන්තර්ජාලයේ සංසරණය වන වීඩියෝවක් පදනම් කර ගනිමින් ගොඩනැගී ඇත.

## මිත්‍යාව

- ✕ කෝවිඩ්-19 එන්නත් කඩිනමින් අනුමත වූ නිසා ආරක්ෂිත වීමට තරම් කල් වැඩිය.
- ✕ කෝවිඩ්-19 එන්නත ලබා ගැනීමෙන් කෝවිඩ්-19 වැළඳිය හැකිය.
- ✕ මගේ කටයුතු ලුහුබැඳීමට කෝවිඩ්-19 එන්නතේ මයික්‍රොචිපයක් අඩංගු වේ.

# එන්නත ගැන තොරතුරු දැන ගන්න

## සත්‍ය

**බටහිර ඔස්ට්‍රේලියාවේ සිටින සියලු දෙනාට එන්නත් නොමිලේ ලැබේ.**
මෙයට තාවකාලික පදිංචිකරුවන්, සරණාගතයන්, සංක්‍රමණිකයන් හා වලංගු වීසා බලපත්‍රයක් නොමැති අය ඇතුළත් වේ.

**එන්නත්වල අඩංගු සෑම අමුද්‍රව්‍යයක් ගැනම අපි දැන සිටිමු.**
එන්නතේ වැඩි වශයෙන් ඇත්තේ ලුනු සහිත ජලය, සීනි හා මේදයයි. එන්නතහි ග්‍රැෆීන් ඔක්සයිඩ්, ග්ලූටන්, බිත්තර, තිරිඟු, මීමැස්සන්ගේ විෂ, ලේටෙක්ස්, හෝ සත්ව නිෂ්පාදන අඩංගු නොවේ. ඔස්ට්‍රේලියානු ෆැට්වා කවුන්සිලය මගින් එන්නත හලාල් සේ සම්මත කර ඇත.

**මෙඩිකෙයා නැත්නම් පවා ඔබට කෝවිඩ්-19 එන්නත ලබා ගත හැකිය.**
හමුවීමේ දී ඔබේ අනන්‍යතාව සනාථ කළ යුතු නිසා ඔබේ නම සඳහන් වන රියදුරු බලපත්‍රයක්, ලිපියක් හෝ බිල්පතක් වැනි දෙයක් රැගෙන එන්න.

**කෝවිඩ්-19 එන්නත ලබා ගැනීමෙන් චුම්බක ක්ෂේත්‍රයක් ඇති නොකෙරේ - ඔබේ සිරුරේ කිසිම තැනක**
මෙවන් දෙයක් කළ හැකි කිසිම චුම්බක ද්‍රව්‍යයක් කෝවිඩ්-19 එන්නතෙහි අඩංගු නොවේ. කාන්දමක් ආකර්ෂණය කර ගැනීමට බොහෝ ලෝහ ප්‍රමාණයක් අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස බොහෝ අය යකඩ අඩංගු මල්ටි විටමින් ගැනීම සිදු කරති. ඒවා ඉතාම තනුක වී ඔබේ සිරුර පුරා විසිරී යන හෙයින් මෙමගින් සිරුර තුළ චුම්බක ශක්තියක් ඇති නොකෙරේ.

**කෝවිඩ්-19 එන්නතින් සරුභාවයට බලපෑමක් නොවේ.**
එන්නත නිසා දැන් හෝ අනාගතයේ දී ඔබට දරුවෙකු සෑදීමේ හැකියාවට බලපෑමක් නොවේ. තමා හා සිය දරුවා ආරක්ෂා කර ගැනීමට කෝවිඩ්-19 එන්නත ගැනීමට ගර්භනී කාන්තාවන්ට දැඩිව නිර්දේශ කෙරේ.

## මිථ්‍යාව

- කෝවිඩ්-19 එන්නතක් ලබා ගැනීමට මුදල් වැය වේ.
- මෙම එන්නත්වල ඇත්තේ මොනවාදැයි අප දන්නේ නැත.
- කෝවිඩ්-19 එන්නත ලබා ගැනීමට ඔබට සක්‍රීය මෙඩිකෙයා කාඩ්පතක් අවශ්‍ය වේ.
- COVID-19 එන්නත් මඟින් ඔබේ අතේ චුම්භක ආකර්ෂණයක් ඇති කළ හැකිය.
- කෝවිඩ්-19 එන්නත නිසා සරුභාවයට බලපෑම් සිදුවේ.

ඔබේ කෝවිඩ්-19 එන්නත ලබා ගැනීමට ලියාපදිංචි වී වේලාවක් වෙන් කරගන්න.

rollupforwa.com.au

13COVID
(13 26843)
භාෂණ පරිවර්තකයෙකු සඳහා *ඔබන්න